දුරකථන ) 2698475
தொலைபேசி ) 2698490
Telephone ) 2698507

ෆැක්ස් ) 2692913
பெக்ஸ் ) 2693869
Fax )

විද්‍යුත් තැපෑල )
மின்னஞ்சல் முகவா ) postmaster@health.gov.lk
e-mail )

වෙබ් අඩවිය )
இணையத்தளம் ) www.health.gov.lk
website )


සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය )
எனது இல ) NCCP/GOSL/12/2019
My No. )

ඔබේ අංකය )
உமது இல )
Your No. : )

දිනය )
திகதி ) 20/05/2019
Date )

# සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
# சுகாதாரம், போசணை மற்றும் சுதேச வைத்திய அமைச்சு
# Ministry of Health, Nutrition & Indigenous Medicine

චක්‍රලේඛ ලිපි අංක : 01-79 /2019

සියලුම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,
සියලුම ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,
සියලුම ආයතන ප්‍රධානීන්,
සියලුම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් වෙත,

**"ලෝක හිස සහ ගෙල ආශ්‍රිත පිළිකා දිනය - 2019"**

වර්ෂ 2011 දී ශ්‍රී ලංකාවේ පුරුෂයින්හට වැළඳුණු පිළිකා අතරින් ප්‍රමුඛතම පිළිකාව මුඛ පිළිකාව වන අතර (පිරිමින්ට වැළඳුනු සියලුම පිළිකා අතරින් 18% පමණ) ගැහැණුන්හට වැළඳුනු පිළිකා අතරින් එය හත්වන ස්ථානය ගනී. ශ්‍රී ලංකාවේ වාර්ෂිකව අළුතින් වාර්තා වන මුඛ පිළිකා රෝගීන් සංඛ්‍යාව 2000 පමණවේ. වර්ෂ 2011දී පිරිමින් සහ කාන්තාවන්ගේ වයස් ප්‍රමාණීකෘත නව මුඛ පිළිකා රෝගීන් අනුපාතය (age standardized incidence rates) ජනගහනය 100,000 කට පිළිවෙළින් 16.4 සහ 4.1 වේ. එයට අමතරව සියළුම පිළිකා අතරින් වැඩිම මරණ අනුපාතිකය ඇත්තේද මුඛ පිළිකාවට වන අතර එය දිනකට මරණ 2-3 පමණ වේ.

බුලත්විට සැපීම නැවැත්වීම, දුම්කොළ හා පුවක් ආශ්‍රිත නිෂ්පාදන භාවිතයෙන් වැළකීම, දුම්පානය සහ මත්පැන් භාවිතයෙන් වැළකීම මඟින් මුඛ පිළිකා වළක්වා ගත හැකිය. එමනිසා මහජනතාව දැනුවත් කරන වැඩසටහන් පැවැත්වීමත්, මුඛ පිළිකා සඳහා වැඩි අවදානම් සහිත කණ්ඩායම් පරීක්ෂා කිරීමත් මගින් මුඛ පිළිකා ව්‍යසනය අවම කරගත හැකිය. මුඛ පිළිකා මුල් අවස්ථාවේදීම හඳුනාගැනීමෙන් ඒවා සුව කරගත හැකි අතර පූර්ව මුඛ පිළිකා අවස්ථාවේදී රෝගය හඳුනාගෙන නිසි පරිදි රෝග කළමනාකරණයෙන් මුඛ පිළිකා සෑදීම වලක්වාගත හැකිය.

මුඛ පිළිකාවන් නිවාරණය සහ පාලනය කිරීම නොයෙකුත් ක්‍රමෝපායන් භාවිතා කලද, මුඛ පිළිකා රෝගීන් වැඩි සංඛ්‍යාවක් හඳුනා ගැනෙන්නේ රෝගයේ අවසන් අවධි වල බැවින් එම රෝගීන්ගේ මරණ අනුපාතිකය ඉහළ මට්ටමක පවතී. වර්ෂ 2011 දී නිකුත් කරන ලද නව පිළිකා දත්ත වාර්තාවට අනුව මුඛ පිළිකා රෝගීන්ගෙන් 76.5% සෞඛ්‍ය ආයතනවලට යොමුවී ඇත්තේ පිළිකා රෝගයේ තුන්වන සහ හතරවන අවධි වලයි. මේ සඳහා ප්‍රධාන හේතුව වශයෙන් අවදානම් කණ්ඩායම් නිසි පරිදි හඳුනා ගත නොහැකි වීම, පූර්ව මුඛ පිළිකා / මුඛ පිළිකාවන් හඳුනාගැනීම සඳහා සිදුකරන පරීක්ෂා පහසුකම්වල දුර්වලතා සහ මහජනතාවගේ මුඛ පිළිකා සම්බන්ධව නොදැනුවත්භාවයයි.

හිස සහ ගෙල ආශ්‍රිත පිළිකාවල ඵලදායී සත්කාරය සහ පාලනය පිළිබඳ අවධානය යොමු කිරීමට ලෝක හිස සහ ගෙල ආශ්‍රිත පිළිකා දිනය සෑම වර්ෂයකම ජූලි 27 දින ලොව පුරා සමරනු ලැබේ. හිස සහ ගෙල ආශ්‍රිත පිළිකා අතරින් ප්‍රමුඛ ස්ථානයක් හිමි වනුයේ මුඛ පිළිකාවන්වලටයි.

මහජනතාවගේ පූර්ව මුඛ පිළිකා සහ මුඛ පිළිකාවලට හේතුකාරක වන අවදානම් සාධක පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීම සඳහා සහ අවදානම් කණ්ඩායම්වල පූර්ව මුඛ පිළිකා සහ මුඛ පිළිකා හඳුනා ගැනීම සඳහා පවත්වනු ලබන වැඩසටහන් ශක්තිමත් කිරීම සඳහා ජූලි, සහ අගෝස්තු මාසවල විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලෙස ජාතික පිළිකා මර්දන වැඩසටහන සියලුම ප්‍රදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්හට දන්වා සිටි. ඒ සඳහා ප්‍රදේශීය දන්ත ශල්‍ය වෛද්‍ය වරුන්, වෛද්‍ය නිලධාරී (බෝ නොවන රෝග), වෛද්‍ය නිලධාරී (සැලසුම්) සහ ප්‍රදේශයේ සිටින සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්, දන්ත ශල්‍ය වෛද්‍යවරුන් සහ පවුල් සෞඛ්‍ය නිලධාරීන්ගේ සක්‍රීය දායකත්වය ලබා ගත හැකිය.

ඔබ ප්‍රදේශයේ ක්‍රියාත්මක කළහැකි ක්‍රියාකාරකම් සහ වැඩසටහන් සමහරක් පහත දැක්වේ.

1. පළාතේ හෝ දිස්ත්‍රික්කයේ සම්පත් දායකයන්ගේ (නිදසුන්: මුඛ හා හණුක ශල්‍ය වෛද්‍යවරුන් සහ දන්ත ශල්‍ය වෛද්‍යවරුන්) සහභාගීත්වයෙන් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්, ප්‍රාථමික සෞඛ්‍ය සේවා වල නියුතු වෛද්‍ය නිලධාරීන් සහ පෞද්ගලික සේවයේ නියුතු වෛද්‍ය නිලධාරීන් සහ පෞද්ගලික සේවයේ නියුතු වෛද්‍යවරුන් සඳහා දේශන, සාකච්ඡා සහ පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම.
2. මුඛ පිළිකා සම්බන්ධ අවදානම් සාධක හඳුනා ගැනීම පිළිබඳ විශේෂ අවධානයක් ඇතිව ප්‍රාථමික සෞඛ්‍ය සේවා නිලධාරීන් වෙනුවෙන් පවත්වන සේවාස්ථ පුහුණු කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම.
3. පාසල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, පළාත් / කලාපීය අධ්‍යාපන අධ්‍යක්ෂ කාර්යාල, පළාත් පාලන ආයතන ආදී රජයේ ආයතන ප්‍රධානීන් වෙනුවෙන් උපදේශන වැඩසටහන් සංවිධානය කිරීම.
4. රජය සහ පෞද්ගලික ආයතන වල කාර්ය මණ්ඩල සඳහා මුඛ පිළිකා නිවාරණය සහ වැළක්වීම සම්බන්ධ දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම.
5. මුඛ පිළිකා සම්බන්ධ දැනුම වර්ධනය කිරීම සඳහා මහජනතාව ඒකරාශී වන ස්ථානයන්හි (නිදසුන්: දුම්රිය ස්ථාන, බස් නැවතුම් පොළවල්, පොදු වෙළඳ පොළවල්- ඉරිදා පොළ ආදියෙහි) පාගමන් සහ ප්‍රදර්ශන වැනි වැඩසටහන් සංවිධානය කිරීම. එවැනි වැඩසටහන් රාජ්‍ය නොවන සංවිධාන, ප්‍රජා මූල සංවිධාන සහ ව්‍යාපාරිකයන්ගේ සංගම් වැනි සිවිල් සමාජ සංවිධාන හරහා පෞද්ගලික සහ රාජ්‍ය නොවන අංශ වෙතහඳුන්වා දීම.
6. දන්ත සායන, සුව දිවි සායන සහ ජංගම සායන වල මුඛ පිළිකා කලින් හඳුනාගැනීමේ වැඩසටහන් සංවිධානය කිරීම .

මෙම වැඩසටහන් සඳහා ජාතික පිළිකා මර්දන වැඩසටහන මගින් ප්‍රදේශීය දන්ත ශල්‍ය වෛද්‍ය වරුන්හට ලබාදී ඇති පත්‍රිකා, පෝස්ටර්, සෞඛ්‍ය අධ්‍යාපන වැඩසටහන් ඇතුලත් වීඩියෝ වැනි සෞඛ්‍ය අධ්‍යාපන මෙවලම් භාවිතා කල හැකිය. හිස සහ ගෙල ආශ්‍රිත පිළිකා දිනය සම්බන්ධයෙන් ඔබ ප්‍රදේශයේ / ආයතනයේ පවත්වන ලද ක්‍රියාකාරකම් පිළිබඳ වාර්තාවක් පිළිකා මර්දන වැඩසටහනෙහි අධ්‍යක්ෂ වෙත 2019 ඔක්තෝම්බර් මස 15 දින හෝ ඊට පෙර ලබා දෙන ලෙස ද දන්වා සිටිමි.
ශ්‍රී ලංකාවේ පවතින මුඛ පිළිකා උවදුර අඩු කර ගැනීමේ අරමුණ ඇතිව මෙයට පහසුකම් සැලසීමට සහ සම්බන්ධීකරණය කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස සියලු ම පළාත් සහ ප්‍රාදේශීය සෞඛ්‍ය බලධාරීන් වෙත උපදෙස් දෙනු ලැබේ.
මෙම ජාතික කර්තව්‍ය සාර්ථක කර ගැනීම උදෙසා ඔබගේ නායකත්වය, උපදෙස් සහ සක්‍රීය දායකත්වය විශේෂයෙන් අගය කරමි.
වැඩිදුර පැහැදිලි කිරීමක් අවශ්‍ය නම් කරුණාකර අධ්‍යක්ෂ, ජාතික පිළිකා මර්දන වැඩසටහන හෝ එහි විශේෂඥ ප්‍රජා දන්ත වෛද්‍යවරයා අමතන්න. (දුරකථන අංක: 0112368627)

**වෛද්‍ය අනිල් ජාසිංහ**
**සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්**

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

පිටපත්:

සියලුම පළාත් සෞඛ්‍ය ඇමතිවරුන්
සියලුම පළාත් සෞඛ්‍ය ලේකම්වරුන්
සියලුම නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරුන්
අධ්‍යක්ෂ, ජාතික පිළිකා මර්දන වැඩසටහන
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (බෝ නොවන රෝග)
අධ්‍යක්ෂ, දන්ත සේවා
අධ්‍යක්ෂ, ප්‍රාථමික සේවා
අධ්‍යක්ෂ, මාතෘ හා ළමා සෞඛ්‍ය
අධ්‍යක්ෂ, සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශය
පළාත් ප්‍රජා වෛද්‍ය විශේෂඥවරුන්, විශේෂඥ ප්‍රජා දන්ත වෛද්‍යවරුන්
ප්‍රධාන වෛද්‍ය නිලධාරී (පාසල් සෞඛ්‍ය)
සියලුම ප්‍රදේශීය දන්ත ශල්‍ය වෛද්‍ය වරුන්
සියළුම වෛද්‍ය නිලධාරී (බෝ නොවන රෝග)
සියළුම වෛද්‍ය නිලධාරී (මාතෘ හා ළමා සෞඛ්‍ය)
සියළුම වෛද්‍ය නිලධාරී (සැලසුම්)